# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 ජනවාරි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 ජනවාරි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 13.50 යි. තැපැල් ගාස්තුව : රු. 6.75 යි.

**2003 අංක 3 දරන මුල්‍ය කළමනාකරණ (වගකීම) පනත**

එල්. ඩී.–ඕ. 61/2002

[සහතිකය සටහන් කළේ 2003 ජනවාරි මස 09 වන දින]

**වගකීම දරන මුල්‍ය කළමනාකරණය මත ආණ්ඩුවේ මුල්‍ය ක්‍රමෝපාය පදනම් වී ඇති බවට සහතිකවීම සඳහා ද ; මුල්‍ය ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කෙරෙන ආකාරය මනාව සමීක්ෂණය කිරීමට මහජනයාට පහසුකම් සැලසීම සඳහා සහ ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2003 අංක 3 දරන මුල්‍ය කළමනාකරණ (වගකීම) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**2.** ආණ්ඩුවේ මුල්‍ය ක්‍රමෝපාය මෙහි මින් මතු සඳහන් කරනු ලබන වගකීම් සහිත මුල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය මත පදනම් විය යුතු ය.

වගකීම් සහිත මුල්‍ය කළමනාකරණය මත ආණ්ඩුවේ ක්‍රමෝපාය පදනම් විය යුතු බව.

**3.** ආණ්ඩුවේ මුල්‍ය ක්‍රමෝපාය සැකෙවින් විස්තර කිරීමේ දී ආණ්ඩුව විසින් අනුගමනය කළ යුතු වගකීම් සහිත මුල්‍ය කළමනාකරණයට පාදක වූ පරමාර්ථ පහත සඳහන් පරිදි වේ :—

වගකීම් සහිත මුල්‍ය කළමනාකරණයට පාදක වන පරමාර්ථ.

(අ) වර්ෂ 2006 අවසානයේ දී අයවැය පරතරය, ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන බවට සහ එම මට්ටම් ඉන්පසු දිගටම පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගැනීමෙන් ආණ්ඩුවේ ණය දූරදර්ශී මට්ටම් දක්වා අඩු කිරීම ;

(ආ) ආණ්ඩුවට මුහුණපෑමට සිදුවන මුල්‍යමය අවදානම්, වෙනස්වන ආර්ථික පරිවේෂණ සැලකිල්ලට ගනිමින්, දූරදර්ශී ලෙස කළමනාකරණය කිරීම ;

(ඇ) ආණ්ඩුවේ ණය අධිකතර මට්ටම්වලට ඉහළ නොනගින පරිදි වියදම් පිළිබඳ ප්‍රතිපත්ති යොදා ගැනීම ;

(ඈ) අනාගත බදු අනුප්‍රමාණ යුක්ති සහගත ස්ථායිත්ව මට්ටම්වලට සහ කල් තබා දැකිය හැකි මට්ටම්වලට අනුකූල වන සේ වියදම් හා බදු අය කිරීමට අදාළ ප්‍රතිපත්ති යොදා ගැනීම ;

(ඉ) ඇපවීම ලෙස ගණන් බලන ලද සහ පවත්නා මුදල් වර්ෂය සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ සියයට ප්‍රමාණයක් ලෙස ඊට ඉහතින් ම වූ මුදල් වර්ෂ දෙකේ ප්‍රමාණය සමග දෙන ලද මුදලේ මුළු එකතුව වර්ෂයකට 4.5% නොඉක්මවන බවට සහතික වීම ;

(ඊ) 2006 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන මුදල් වර්ෂය අවසානයේ දී (එවකට පවත්නා විනිමය අනුප්‍රමාණ අනුව ගණන් බලනු ලබන බාහිර ණය ඇතුළුව) ආණ්ඩුවේ මුළු බැරකම් ඒ මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට අසූපහක් නොඉක්මවන බවට සහ, 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන මුදල් වර්ෂය අවසානයේ දී(එවකට පවත්නා විනිමය අනුප්‍රමාණ අනුව ගණන් බලනු ලබන බාහිර ණය ඇතුළුව) ආණ්ඩුවේ මුළු බැරකම් ඒ මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට හැටක් නොඉක්ම වන බවට සහතික වීම ; සහ

(උ) ආණ්ඩුවේ ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීමේ දී අනාගත පරම්පරා කෙරෙහි ඇති කරනු ලැබිය හැකි මූල්‍ය බලපෑම් ගැන සලකා බලා එම තීරණ ගනු ලබන බවට සහතික වීම.

මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය.

4. (1) ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය, (මෙහි මින් මතු "ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(2) සෑම වර්ෂයකම විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී දෙවන වරට කියවීමට නියම කරන ලද දිනයේ දී, ආණ්ඩුවේ ප්‍රකාශය මහජනයා වෙත ප්‍රචාරය කිරීමට සහ පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු හේතු මත, ආණ්ඩුව විසින් කවර වේලාවක දී වුව ද ඒ ප්‍රකාශය වෙනස් කරනු ලැබිය හැකි ය.

(4) ආණ්ඩුව විසින් ස්වකීය ප්‍රකාශය වෙනස් කරනු ලැබූ අවස්ථාවක දී ප්‍රතිශෝධිත ප්‍රකාශය මහජනයා වෙත ප්‍රචාරය කිරීමට සහ පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු අතර ප්‍රතිශෝධිත ප්‍රකාශය මුද්‍රා හරින ලද දින සිට එය බලාත්මක විය යුතු ය.

(5) (අ) ප්‍රතිශෝධිත ප්‍රකාශය ප්‍රචාරය කරන ලද දිනයේ පාර්ලිමේන්තුවේ රැස්වීම පැවැත්වෙන්නේ නම්, එසේ ප්‍රචාරය කරන ලද දිනයේ සිට සති දෙකක කාලයක් තුළ දී ඒ ප්‍රකාශයේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීම ; හෝ

(ආ) ප්‍රතිශෝධිත ප්‍රකාශය ප්‍රචාරය කරන ලද දිනයේ දී පාර්ලිමේන්තුව රැස් නොවන්නේ නම් ඊළඟට පාර්ලිමේන්තුව රැස්වන දින සිට සති දෙකක් තුළ දී ඒ ප්‍රකාශය පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීම,

අමාත්‍යවරයා විසින් කරනු ලැබිය යුතු ය.

**5.** ආණ්ඩුවේ මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මහජනයාගේ දැනීම නංවාලීම සහ ආණ්ඩුව විසින් මූල්‍ය ක්‍රමෝපාය පවත්වා ගෙන යන ආකාරය ඇගයීමේ ප්‍රමිති ස්ථාපිත කිරීම ප්‍රකාශයක පරමාර්ථ වේ. ප්‍රකාශයේ පරමාර්ථ.

**6.** ප්‍රකාශයක් මගින්, - ප්‍රකාශයක අන්තර්ගතය.

(අ) ආණ්ඩුවේ කෙටි කාලීන මූල්‍ය අරමුණු සකස් කළ යුත්තේ ආණ්ඩුවේ කවර මධ්‍ය කාලීන මූල්‍ය ප්‍රතිපත්තියක් තුළ පිහිටා ද ඒ ප්‍රතිපත්ති නිශ්චිතව දැක්විය යුතු ය ;

(ආ) අයවැය ලේඛනය පදනම් කර ඇත්තේ හෝ පදනම් කරනු ලබන්නේ කවර පුළුල් ක්‍රමෝපාය ප්‍රමුඛතා මත ද ඒ ප්‍රමුඛතා පැහැදිලි කරනු ලැබිය යුතු ය ;

(ඇ) ක්‍රමෝපාය සහ ක්‍රියාත්මක කිරීමට ඇති සමස්ත මූල්‍ය ප්‍රතිපත්තිය අරභයා වැදගත් යයි ආණ්ඩුව විසින් සලකනු ලබන ප්‍රධාන මූල්‍ය ක්‍රියාමාර්ග නිශ්චිතව දැක්විය යුතු ය ;

(ඈ) මූල්‍ය ප්‍රතිපත්තියට අනුකූලව ඊළඟ මුදල් වර්ෂය සහ ඊට අනුයාත මුදල් වර්ෂ තුන සම්බන්ධයෙන් -

(i) සේවක අර්ථසාධක අරමුදලට හෝ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට හෝ ආණ්ඩුව ණය වී ඇත්නම් ඒ පිළිබඳව විශේෂයෙන් සඳහන් කරමින් වියදම, ආදායම, ණය සහ වෙනත් මූල්‍ය කාරණාවලට අදාළ ආණ්ඩුවේ මූල්‍ය අරමුණු හා ඉලක්ක ;

(ii) (ඇ) ඡේදයේ සඳහන් ප්‍රධාන ක්‍රියාමාර්ගවලින් අපේක්ෂා කරන ප්‍රතිඵල,

නිශ්චිතව සඳහන් කළ යුතු ය ;

(ඉ) ඉහත (අ), (ආ), සහ (ඇ) වන ඡේදවල සඳහන් මූල්‍ය අරමුණු හා ක්‍රමෝපාය ප්‍රමුඛතා, වගකීම් සහිත මූල්‍ය කළමනාකරණ මූලධර්මවලට අනුකූල වන්නේ කෙසේ දැ යි පැහැදිලි කරනු ලැබිය යුතු ය ;

(ඊ) එම අරමුණු සහ ප්‍රමුඛතා, වගකීම දරන මූල්‍ය කළමනාකරණ මූලධර්මවලට සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනස් වන්නේ නම්, -

(i) එසේ වෙනස්වීමට හේතු ;

(ii) එම මූලධර්ම කරා ආපසු යාමට ආණ්ඩුව ගන්නා පියවර ;

(iii) එම මූලධර්ම කරා ආණ්ඩුව ආපසු යන්නේ කුමන කාලයක් තුළ දි ද යන්න,

පැහැදිලි කරනු ලැබිය යුතු ය;

(උ) එම ප්‍රකාශය පෙරාතුව ම වූ ප්‍රකාශයෙන් වෙනස් වන්නේ නම්, එම වෙනස්වීම සාධාරණීකරණය කෙරෙන හේතු සාධක ඉදිරිපත් කළ යුතු ය.

අයවැය ආර්ථිකය සහ මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාව.

**7.** සෑම වර්ෂයක දී ම පාර්ලිමේන්තුවේ දී විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීම සඳහා නියම කර ඇති දිනයේ දී අයවැය ආර්ථිකය සහ මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය.

අයවැය ආර්ථිකය සහ මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවේ අරමුණ.

**8.** ආණ්ඩුවේ ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ මූල්‍ය කාර්ය සාධනය අගැයීමේ පදනමක් වශයෙන් යොදා ගැනීමට ඉවහල් වන තොරතුරු සැපයීම අයවැය ආර්ථිකය සහ මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාව පිළියෙල කිරීමේ අරමුණ වන්නේ ය.

අයවැය ආර්ථිකය සහ මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවේ අන්තර්ගතය.

**9.** (1) ඊළඟ මුදල් වර්ෂයට සහ ඉන්පසු එළඹෙන අනුයාත මුදල් වර්ෂ දෙකට අදාළව පහත දැක්වෙන තොරතුරු, අයවැය ආර්ථිකය සහ මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවේ අන්තර්ගත විය යුතුය :—

(අ) දළ දේශීය නිෂ්පාදිතයට සම්බන්ධ ඇස්තමේන්තු ;

(ආ) පාරිභෝගික මිල ගණන්වලට සම්බන්ධ ඇස්තමේන්තු ;

(ඇ) රැකියාව සහ විරැකියාවට සම්බන්ධ ඇස්තමේන්තු ;

(ඈ) ගෙවීම් ශේෂවල වර්තමාන ගිණුම් තත්ත්වයට සම්බන්ධ ඇස්තමේන්තු ;

(ඉ) ආදායම් සහ වියදම් සම්බන්ධ ඇස්තමේන්තු ;

(ඊ) ආණ්ඩුව විසින් ගනු ලබන ණය සම්බන්ධ ඇස්තමේන්තු ;

(උ) ඉහත (අ) සිට (ඊ) දක්වා වූ ඡේදවල සඳහන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී උපයෝගී කර ගනු ලැබූ පදනම, ආර්ථික හෝ වෙනත් දේ ;

(ඌ) එවැනි ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී උපයෝගී කර ගනු ලැබූ ආර්ථික හෝ වෙනත් පදනම විෂයෙහි ලා සිදු විය හැකි වෙනස්වීම් කෙරෙහි බලපාන ඉහත සඳහන් ඇස්තමේන්තුවල සංවේදීතාවට අදාළ ප්‍රකාශයක් ;

(ඊ) මුදල් තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන -

(i) යම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුව විසින් ප්‍රදානය කරනු ලැබූ ඇපකර සහ මුක්තිදන ඇතුළු අවිනිශ්චිත බැරකම් ;

(ii) ඉහත (ඉ) ඡේදයේ සඳහන් ඇස්තමේන්තුවලට ඇතුළත් නොකළ ආණ්ඩුවේ වියදම් පිළිබඳව වූ ආණ්ඩුවේ යෝජනා සම්බන්ධයෙන් ජනතාව වෙත කරනු ලබන දැනුම්දීම් ;

(iii) අවසාන නොවී පවත්වාගෙන යමින් ඇති ආණ්ඩුවේ ප්‍රමන්ත්‍රණ,

වැනි අවදානම් ප්‍රායෝගික වශයෙන් කළ හැකිතාක් දුරට ප්‍රමාණාත්මක කළ ප්‍රකාශයක් ; සහ

(ඒ) එකී එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් ආණ්ඩුවේ මුදල් තත්ත්වය සැහෙන ප්‍රමාණයකට පිළිබිඹු කර දැක්වීමට අවශ්‍ය වෙනත් තොරතුරු.

(2) (3) වන උප වගන්තියේ විධිවිධානවලට යටත් වූ අයවැය ආර්ථික හා මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවේ අන්තර්ගත තොරතුරු සැපයීමේ දී, මුදල් සහ ආර්ථික තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කෙරෙන ආණ්ඩුවේ සියලුම තීරණ හා වෙනත් සියලු පරිවේෂණ කෙරෙහි, හැකිතාක් දුරට, සැලකිල්ල දැක්විය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ ලිඛිත මතය අනුව, -

(අ) ජාතික ආරක්ෂාවට අගතිකාරී වන ;

(ආ) ප්‍රමන්ත්‍රණ, නඩු පැවරීම් හෝ වාණිජ කටයුතු කෙරෙහි සැලකිය යුතු ආකාරයකට ශ්‍රී ලංකාව පාත්‍ර කෙරෙන

යම් තොරතුරක් අයවැය ආර්ථික සහ මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි ඇතුළත් කිරීමට නියම කරන්නේ යයි මේ වගන්තියේ ඇතුළත් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

**10.** (1) සෑම වර්ෂයක්ම සම්බන්ධයෙන් වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවක් අදාළ වර්ෂයේ ජුනි මාසයේ අවසාන දින හෝ විසර්ජන පනත සම්මත කරනු ලැබූ දින සිට මාස හයක් ගතවීම හෝ යන දෙකින් පසුව එළඹෙන දිනයේ දී මහජනයා වෙත ප්‍රචාරය කිරීමට අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය. වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාව.

(2) අමාත්‍යවරයා විසින්, -

(අ) වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාව ප්‍රචාරයට පත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් වේ නම්, ඒ වාර්තාව ප්‍රචාරයට පත් කරන ලද දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය ; නැතහොත්

(ආ) වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ප්‍රචාරයට පත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස් නොවන දිනයක් වේ නම්, පාර්ලිමේන්තුව ඊළඟට රැස්වන දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය.

**11.** ආණ්ඩුවේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව යාවත්කාල තොරතුරු සැපයීම සහ, එමගින්, ආණ්ඩුවේ මූල්‍ය කාර්ය සාධනය එවකට ආණ්ඩුවේ ප්‍රකාශයේ දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය සමග සසඳා අගැයීමට මහජනයාට අවස්ථාව ලබාදීම වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවේ අරමුණ වන්නේ ය. වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවේ අරමුණ.

**12.** (1) යම් මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් වූ වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ පහත සඳහන් දෑ අන්තර්ගත විය යුතු ය :— වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ අන්තර්ගතය.

(අ) ඒ වර්ෂයේ පළමු මාස හතර සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම සහ සැබෑ වියදම පිළිබඳ ප්‍රකාශයක් ;

(ආ) ඒ වර්ෂයේ පළමු මාස හතර සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම සහ සැබෑ ආදායම පිළිබඳ ප්‍රකාශයක් ;

(ඈ) ඒ වර්ෂයේ පළමු මාස හතර සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල් ගලනය සහ සැබෑ මුදල් ගලනය පිළිබඳ ප්‍රකාශයක් ;

(ඈ) ඒ වර්ෂයේ පළමු මාස හතර සඳහා ඇස්තමේන්තු කරන ලද ණයට ගැනීම් සහ සැබෑ ණයට ගැනීම් පිළිබඳ ප්‍රකාශයක් ;

(ඉ) ඒ මුදල් වර්ෂයේ පළමු මාස හතර සම්බන්ධයෙන් ආණ්ඩුවේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් ලෙස පිළිඹිබු කිරීමට අවශ්‍ය වෙනත් ප්‍රකාශ.

(2) ඇස්තමේන්තු කළ අදායමේ හෝ මුදල් ගලනයෙහි හෝ හිඟතාවක් නැතහොත් ඇස්තමේන්තු කළ වියදමේ හෝ ණයට ගැනීම්වල හෝ අතිරික්තයක් තිබෙන විට, ඒ හිඟතාවට හෝ අතිරික්තයට හෝ හේතු එකී වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවෙන් ප්‍රකාශ කරනු ලැබිය යුතුය.

(3) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවේ අඩංගු තොරතුරු සැපයීමේ දී (ඒ වර්ෂය සඳහා විසර්ජන පනත සම්මත කරනු ලැබීමෙන් පසු ගනු ලැබූ තීරණ හා තත්කාලයේ පවත්නා පරිවේෂණ ඇතුළුව) මුල්‍ය තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලැබිය හැකි ආණ්ඩුවේ සියලුම තීරණ හා වෙනත් සියලු පරිවේෂණ, හැකිතාක් දුරට, සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයාගේ ලිඛිත මතය අනුව, —

(අ) ජාතික ආරක්ෂාවට අගතිකාරී වන ;

(ආ) ප්‍රමන්ත්‍රණ, තඩු පැවරීම් හා වාණිජ කටයුතු කෙරෙහි සැලකිය යුතු ආකාරයකට ශ්‍රී ලංකාව පාත්‍ර කරනු ලැබිය හැකි,

යම් තොරතුරක් වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි ඇතුළත් කිරීමට නියම කරනු ලබන බවත් මේ වගන්තියෙහි ඇතුළත් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

(5) වර්ෂය මැද මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවක ඇතුළත් කිරීමට නියමිත යම් කරුණක් පිළිබඳ යම් තොරතුරක්, අවසාන

වරට නිකුත් කළ අයවැය ආර්ථික සහ මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවේ ඒ කරුණුවට අදාළ තොරතුරුවලට වඩා වෙනස් නොවී ඇති අවස්ථාවක දී ඒ තොරතුරු එසේ නොවෙනස්ව පවත්නා බව වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ සඳහන් කරනු ලැබිය යුතු ය.

අවසාන අය වැය තත්ත්වය පිළිබඳ වාර්තාව.

**13.** (1) එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක්, ඒ මුදල් වර්ෂය අවසානවීමෙන් පසු මාස පහක් ගතවීමට පෙර මහජනයා වෙත නිකුත් කිරීමට අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය.

(2) (අ) අවසාන අයවැය තත්වය පිළිබඳ වාර්තාව නිකුත් කරනු ලැබූ දිනයේ දී පාර්ලිමේන්තුව රැස්වන්නේ නම්, ඒ වාර්තාව නිකුත් කළ දින සිට සති දෙකක් තුළ දී එහි පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය ; නැතහොත්

(ආ) අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් නොවන්නේ නම් පාර්ලිමේන්තුව ඊළඟට රැස්වන දින සිට සති දෙකක් ඇතුළත දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය.

(3) මුදල් වර්ෂයක අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව, යම් මුදල් වර්ෂයක් ආරම්භ වීමෙන් පසු ඒ මුදල් වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන අයවැය ආර්ථික සහ මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාව සමග ඒකාබද්ධ කරනු ලැබිය හැකි ය.

අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවේ අරමුණ.

**14.** ආණ්ඩුවේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව යාවත්කාල තොරතුරු සැපයීම සහ එමගින් ආණ්ඩුවේ මූල්‍ය කාර්ය සාධනය එවකට ආණ්ඩුවේ ප්‍රකාශයේ දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය සමග සසඳා අගැයීමට එමගින් මහජනයාට අවස්ථාව ලබාදීම අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවේ අරමුණ වන්නේ ය.

අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවේ අන්තර්ගතය.

**15.** (1) මුදල් වර්ෂයක් වෙනුවෙන් අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවට පහත දැක්වෙන දෑ ඇතුළත් විය යුතු ය :–

(අ) ඒ වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ වියදම සහ සැබවින් දරන ලද වියදම පිළිබඳ ප්‍රකාශයක් ;

(ආ) ඒ වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ අදායම සහ සැබෑ ආදායම පිළිබඳ ප්‍රකාශයක් ;

(ඇ) ඒ වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ මුදල් ගලනය සහ සැබෑ මුදල් ගලනය පිළිබඳ ප්‍රකාශයක් ;

(ඈ) ඒ වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ණයට ගැනීම් සහ සැබෑ ණයට ගැනීම් පිළිබඳ ප්‍රකාශයක් ;

(ඉ) ඒ මුදල් වර්ෂය අවසානයේ දී ආණ්ඩුවේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් ලෙස පිළිඹිබු කිරීමට අවශ්‍ය වෙනත් ප්‍රකාශ.

(2) ඇස්තමේන්තු කළ ආදායමේ හෝ මුදල් ගලනයේ හෝ යම් හිඟතාවක් ඇතිවුවහොත්, නැතහොත් ඇස්තමේන්තු කළ වියදමේ හෝ ණයට ගැනීම්වල හෝ අතිරික්තයක් තිබෙන විට ඒ හිඟතාවට හෝ අතිරික්තයට හේතු එකී අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව.

**16.** (1) පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සඳහා මහමැතිවරණයක් පැවැත්වීමට නියම කරමින් ප්‍රකාශනයක් හෝ ආඥාවක් ප්‍රසිද්ධ කර සති තුනක් ඇතුළත දී, රටේ මුදල් තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක් මහජනයා වෙත නිකුත් කිරීමට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු යෙදිය යුතු ය.

(2) අලුත් පාර්ලිමේන්තුව පළමු වරට රැස් වූ දින සිට සති දෙකක් තුළ දී (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය.

මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවේ අන්තර්ගතය.

**17.** (1) තත්කාලීන මුදල් වර්ෂය සඳහා වූ පහත දැක්වෙන තොරතුරු, මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ සෑම වාර්තාවකම අන්තර්ගත විය යුතු ය :—

(අ) ආදායම සහ වියදම පිළිබඳ ඇස්තමේන්තු ;

(ආ) ආණ්ඩුවේ ණය පිළිබඳ ඇස්තමේන්තු ;

(ඇ) එම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී උපයෝගී කොට ගත් ආර්ථික සහ වෙනත් ආදාන ;

(ඈ) මුදල් තත්ත්වය කෙරෙහි සැලකිය යුතු ලෙස බලපාන,-

(i) යම් පනතක් යටතේ ආණ්ඩුව විසින් දෙන ලද ඇපකර සහ මුක්තිදාන ඇතුළු අවිනිශ්චිත බැරකම් ;

(ii) ඉහත (අ) ඡේදයේ සඳහන් ඇස්තමේන්තුවල ඇතුළත් නොකළ, ආණ්ඩුව විසින් වැය කරනු ලබන බවට ප්‍රසිද්ධියේ පළ කරන ලද යෝජනා ;

(iii) කෙරීගෙන යන අවසන් නොවූ ආණ්ඩුවේ ප්‍රමන්ත්‍රණ,

වැනි ප්‍රමාණීකෘත කළ අවදානම් පිළිබඳව, ප්‍රායෝගිකව, කළහැකි තාක් දුරට, පිළියෙල කළ ප්‍රකාශයක් ; සහ

(ඉ) එකී වාර්තාවේ දිනයේ දී පැවති මූල්‍ය තත්ත්වය යුක්ති සහගතව පිළිඹිබු කර දැක්වීමට අවශ්‍ය වෙනත් තොරතුරු.

(2) මුදල් තත්ත්වය පිළිබඳව සැලකිය යුතු බලපෑමක් ඇති කරන ආණ්ඩුවේ යම් තීරණයක් හැකිතාක් පුළුල් ප්‍රමාණයට, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවේ තොරතුරුවලට ඇතුළත් විය යුතු ය.

(3) යම් තොරතුරක් හෙළිදරව් කිරීම, අමාත්‍යවරයාගේ ලිඛිත මතය ප්‍රකාර,-

(අ) ජාතික ආරක්ෂාවට අගතිකාරී වන ;

(ආ) ප්‍රමන්ත්‍රණවල දී, නඩු පැවරීමේ දී හෝ වාණිජ කටයුතුවල දී, ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රමාණයට අයිරු තත්ත්වයකට පත් වන,

යම් තොරතුරක් මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවට ඇතුළත් කළ යුතු යයි මේ වගන්තියේ ඇතුළත් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

(4) මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක ඇතුළත් කළ යුතු යයි නියමිත යම් තොරතුරක්, කලින් වූ අයවැය ආර්ථික හා මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවක හෝ වර්ෂය මැද අයවැය මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවක ඒ කාරණය සම්බන්ධයෙන් ඇතුළත් කොට තිබුණු තොරතුරුවලින් නොවෙනස්ව පවත්නා අවස්ථාවක දී ඒ තොරතුර එකී වාර්තා දෙකින් එකක හෝ ඒ වාර්තා දෙකෙහිම හෝ අඩංගු තොරතුරුවලින් නොවෙනස්ව පවත්නා බව ඒ මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි සඳහන් කරනු ලැබිය යුතු ය.

මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව පිළියෙල කිරීමට අවශ්‍ය තොරතුරු අමාත්‍යවරයා විසින් සැපයිය යුතු බව.

**18.** පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සඳහා මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කෙරෙන ප්‍රකාශනය හෝ ආඥාව ප්‍රසිද්ධ කිරීමෙන් පසු , –

(අ) අමාත්‍යවරයා දන්නා වූ ; සහ

(ආ) සැලකිය යුතු ප්‍රමාණයකට මූල්‍ය හෝ ආර්ථික පැටලිලි ඇති කරවන්නා වූ හෝ ඇති කිරීමට ඉඩ ඇති,

ආණ්ඩුවේ තීරණ සහ වෙනත් පරිවේෂණ, 16 වන වගන්තිය යටතේ මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාවක් පිළියෙල කිරීමට ලේකම්වරයාට හැකි වනු පිණිස, එකී ප්‍රකාශනය හෝ ආඥාව ප්‍රසිද්ධ කොට එක් සතියක් තුළ දී අමාත්‍යවරයා විසින් ලේකම්වරයා වෙත අනාවරණය කරනු ලැබිය යුතු ය.

වගකීම පිළිබඳ ප්‍රකාශය.

**19.** මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ සෑම වාර්තාවක් සමගම පහත දැක්වෙන ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :–

(අ) අමාත්‍යවරයා විසින් 18 වන වගන්තියේ නියමයන්ට අනුකූලව කටයුතු කර ඇති බවට අමාත්‍යවරයා විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක් ;

(ආ) වාර්තාවේ අඩංගු තොරතුරු මගින් හැකි තරම් පුළුල් ලෙස-.

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයන්ගේ උපරිම වෘත්තීය විනිශ්චය පිළිබිඹු වන බවට ;

(ii) අමාත්‍යාංශය විසින් ලබා ගත හැකි වූ සියලුම ආර්ථික සහ මූල්‍ය තොරතුරු කෙරේ සැලකිල්ල දක්වා ඇති බවට ;

(iii) 19 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් තමාට අනාවරණය කළ ආණ්ඩුවේ තීරණවලින් ඇතිවන මූල්‍ය පැටලිලි හා වෙනත් පරිවේෂණ එකී තොරතුරුවලට ඇතුළත් කොට ඇති බවට,

ලේකම්වරයා විසින් කරන ලද ප්‍රකාශයක්.

මහ බැංකුවෙන් ණයට ගැනීම් සීමාකිරීම්.

**20.** (1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව මිස, ආණ්ඩුව විසින් මහ බැංකුවෙන් මුදල් ණයට නොගත යුතු ය.

(2) මුදල් වර්ෂයක දී ලැබෙන මුදල් ප්‍රමාණ අභිභවා යන මුදල් යෙදවුම්වල අතිරික්තය තාවකාලිකව පියවා ගැනීම සඳහා අත්තිකාරම් ලෙස ආණ්ඩුව විසින් මහ බැංකුවෙන් මුදල් ණයට ගනු ලැබිය හැකි ය :

එසේ වුව ද, එවැනි සෑම අත්තිකාරමක්ම, එය ලබා ගත් දින සිට මාස හයක් තුළ දී ආපසු ගෙවනු ලැබිය යුතු අතර යම් මුදල් වර්ෂයක කවර වුව ද අවස්ථාවක දී හිඟ තබා ඇති එවැනි අත්තිකාරම්වල එකතුව ඒ මුදල් වර්ෂය සඳහා ආණ්ඩුවේ ඇස්තමේන්තුගත ආදායමින් සියයට දහයක් නොඉක්මවිය යුතු ය.

(3) ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත්වල මුල් නිකුතුවලට දායකවීම මේ වගන්තියේ අඩංගු කිසිවකින් මහ බැංකුවට තහනම් කරනු ලබන්නේ යයි නොසැලකිය යුතු ය.

වාර්තා සහ ප්‍රකාශ, ගිණුම් ප්‍රමිතිවලට අනුකූල විය යුතු බව.

**21.** මේ පනතේ සඳහන් සියලුම ප්‍රකාශ සහ වාර්තා, රාජ්‍ය අංශයේ ගිණුම්වලට අදාළ ගිණුම් තැබීමේ ක්‍රම පිළිබඳ උපරිම පරිචයන්ට අනුකූලව පිළියෙල කරනු ලැබිය යුතු ය.

තොරතුරු ලබා ගැනීමට ලේකම්වරයා සතු බලය.

**22.** (1) 4 වන වගන්තියේ සඳහන් ප්‍රකාශය සහ 7, 10, 13 සහ 16 වන වගන්තිවල සඳහන් වාර්තා පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු තමා වෙත සපයන ලෙස මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කවර වුව ද අමාත්‍යාංශයකින්, දෙපාර්තමේන්තුවකින්, රාජ්‍ය සංස්ථාවකින් හෝ ආණ්ඩුවට කොටස් අයත්ව ඇති යම් සමාගමකින් ලිඛිතව ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ සමාගමක් වෙත (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, අදාළ ප්‍රකාශ හෝ වාර්තාව පිළියෙල කිරීමේ දී අවශ්‍ය තොරතුරු ගණන් ගැනීම සඳහා ලේකම්වරයාට අවකාශ ලැබෙන කාලයක් තුළ දී ඒ ඉල්ලීමට අනුකූලව ඒ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, රාජ්‍ය සංස්ථාව හෝ සමාගම කටයුතු කළ යුතු ය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර කමිටුවලට වාර්තා යොමු කිරීම.

**23.** 4 වන වගන්තියේ සඳහන් ප්‍රකාශය සහ 7, 10, 13 සහ 16 වන වගන්තිවල සඳහන් වාර්තා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබූ විට ඒ ප්‍රකාශය සහ වාර්තා පාර්ලිමේන්තුවේ අදාළ ස්ථාවර කමිටුව වෙත යොමු කරනු ලැබිය යුතු ය.

වාර්තා පළ කිරීම සහ විකිණීම.

**24.** මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින්,-

(අ) 4 වන වගන්තියේ සඳහන් ප්‍රකාශයේ සහ 7, 10, 13 හා 16 වන වගන්තිවල සඳහන් වාර්තාවල පිටපත් ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලීමට තබා ඇති ස්ථානය නිශ්චිතව දැනුම් දිය යුතු ය ; තව ද

(ආ) ඒ ප්‍රකාශයේ සහ වාර්තාවල පිටපත් විකිණීම සඳහා තබා ඇති ස්ථානය නිශ්චිතව දැනුම් දිය යුතු ය.

නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂාව.

**25.** මේ පනත යටතේ රජයේ නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් ඒ නිලධරයාට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

**26.** (1) අතිවිශේෂ අවස්ථාවල දී පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් දෙනු ලබන පාර්ලිමේන්තු අනුමතය යටතේ සහ ඒ යෝජනා සම්මතයේ නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදය තුළ, ආණ්ඩුව විසින් මේ පනතේ නියමයන්ගෙන් බැහැරව සිටිනු ලැබිය හැකි ය.

මේ පනතේ විධිවිධානවලින් බැහැර යාම.

(2) මේ පනතේ නියමයන්ගෙන් බැහැරව සිටීමට ඉල්ලීමක් කරනු ලැබූ සෑම අවස්ථාවක දී ම-

(අ) එසේ බැහැරව සිටීමට හේතු ;

(ආ) එසේ බැහැරව සිටීම අවශ්‍ය කරනු ලැබූ හේතු පිටු දැකීමට ආණ්ඩුව විසින් ගනු ලබන පියවර ;

(ඇ) නියමයන්ගෙන් එසේ බැහැරව සිටීම අවසාන කිරීමට ආණ්ඩුව බලාපොරොත්තුවන කාලය,

අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු ය.

(3) බැහැරවීමක් සිදු කරනු ලැබූ සෑම අවස්ථාවක දී ම,-

(අ) එම බැහැරව සිටීම අවශ්‍ය වූ දිනයේ දී පාර්ලිමේන්තුව රැස් වන්නේ නම්, ඒ බැහැරව සිටීමට අදාළව (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරුණු, එසේ බැහැර වූ දින සිට සති දෙකක් තුළ දී ඒ බව පාර්ලිමේන්තුව වෙත දැනුම් දීම ; හෝ

(ආ) එම බැහැරව සිටීම කළ දිනයේ දී පාර්ලිමේන්තුව රැස් නොවන්නේ නම්, ඒ බැහැරව සිටීමට අදාළව (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරුණු, පාර්ලිමේන්තුව ඊළඟට රැස් වන දින සිට සති දෙකක් තුළ දී පාර්ලිමේන්තුව වෙත දැනුම් දීම,

අමාත්‍යවරයා විසින් කරනු ලැබිය යුතු ය.

**27.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළැඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.